# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,687 - 2010 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2010.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2398 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


2395- B 80184— 8,855 (2010/12)
B1-

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට/ විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2010

මෙම නිවේදනයේ 'ලේකම්' යන්නෙන් අදහස් කරනුයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ය. 'සේවය' යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයයි 'ව්‍යවස්ථාව' යනුවෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

01. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ තනතුරු පුරප්පාඩු පිරවීමට සීමිත තරග විභාගයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ. පහත දැක්වෙන නිවේදනයට අනුකූලව ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සීමිත තරග විභාග ප්‍රතිඵල මත සේවයේ III වැනි පන්තියේ පුරප්පාඩුවලින් සියයට හතළිස්පහකට (45%) නොවැඩි පුරප්පාඩු සංඛ්‍යාවකට පත්කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ඇත.

02. *විභාග දිනය* - මෙම විභාගය 2011 අප්‍රේල් මාසයේ දී පැවැත්වේ. මෙම විභාගය කල් දැමීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

03. සේවක සංඛ්‍යාව හා පත්කිරීමේ දිනය :

(i) සේවයේ III වැනි පන්තියේ සේවක සංඛ්‍යාව "සාමාන්‍ය" සේවක සංඛ්‍යාවකින් සහ 'විශේෂ' සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

(ii) එක් අයැදුම්කරුවකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ පහත 03 (ආ) වන ඡේදයේ සඳහන් ක්ෂේත්‍රයන් හි පුරප්පාඩු සඳහා ද අයැදුම් කළ හැකිය. එක් අයැදුම්කරුවකුට සාමාන්‍ය සේවක සංඛ්‍යාවට සහ විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ ක්ෂේත්‍ර දෙකකට අයැදුම් කළ හැකිය. විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයැදුම් කරනු ලබන්නේ නම් එහි දී ඉල්ලුම් කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යාවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් 1/3 ක් වත් අයැදුම් කරන විෂයට අදාළ වන විෂයන් විය යුතු ය. සැලසුම් හා විශේෂ අධ්‍යාපන විෂයන් සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනම දක්වා ඇත.

(iii) විශේෂ සේවක සංඛ්‍යාවේ විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත දක්වනු ලැබේ. තමා අයැදුම්කරන විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක අයැදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතු ය.

| | *සංකේත අංකය* |
|---|---|
| (අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව | 11 |
| (ආ) විශේෂ සේවක සංඛ්‍යාව : | |

| *විෂය ක්ෂේත්‍රය* | *සංකේත අංකය* |
|---|---|
| ඉංග්‍රීසි | 21 |
| ගණිතය | 22 |
| විද්‍යාව | 23 |
| චිත්‍ර කලාව | 24 |
| සංගීතය (පෙරදිග) | 25 |
| සංගීතය (අපරදිග) | 26 |
| නැටුම් | 27 |
| ශාරීරික අධ්‍යාපනය | 28 |
| කෘෂි විද්‍යාව | 29 |
| වාණිජ්‍ය විද්‍යාව | 30 |
| හස්ත කර්මාන්තය | 31 |
| ගෘහ විද්‍යාව | 32 |
| විශේෂ අධ්‍යාපන | 33 |
| සැලසුම් | 34 |
| අරාබි | 35 |
| තොරතුරු තාක්ෂණය | 36 |
| පිරිවෙන් | 37 |

*සැ.යු :-සීමිත තරග විභාග යටතේ විශේෂ සේවක සංඛ්‍යාවේ විශේෂ අධ්‍යාපනය යන විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත්ව තිබිය යුතු ය.*

ඌනතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය (විශේෂ අධ්‍යාපනය) සම්බන්ධයෙන් පිරිනැමෙන අධ්‍යාපනවේදී උපාධි සහතිකය

විශේෂ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය

විශේෂ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධි සහතිකය

විශේෂ සේවක සංඛ්‍යාවේ සැලසුම් විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත්ව තිබිය යුතු ය. :

සංඛ්‍යාන විද්‍යාව උපාධියට විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් වෙනත් විෂයයක අනු විෂයය ක්ෂේත්‍රයක් වශයෙන් හදාරා තිබීම.

ගණිතය උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂය ක්ෂේත්‍රයට අනු විෂයයක් වශයෙන් හදාරා තිබීම.

කළමනාකරණ හා සැලසුම් ශිල්ප ක්‍රම උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂයන්ට අයත් අනු විෂයයක් ලෙසට හදාරා තිබීම.

අධ්‍යාපන විද්‍යාව, මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍ර උපාධි විෂයයක් ලෙසට හෝ උපාධියට අයත් විෂයන්ගේ අනුවිෂයයක් ලෙසට හදාරා තිබීම.

සමාජ විද්‍යාව උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂයයක අනුවිෂයයක් ලෙසට හදාරා තිබීම.

ජෛවීය විද්‍යා හෝ භෞතීය විද්‍යා උපාධි විෂයන් සමග සංඛ්‍යානය හෝ පර්යේෂණ කටයුතු, උපාධි අනු විෂයකට අයත් විෂය කොටස් ලෙසට හදාරා තිබීම.

පිරිවැයකරණය හා ආර්ථික මූලධර්ම උපාධි විෂයන් සමග උපාධියට අයත් විෂයයන්ට පිරිවැය විශ්ලේෂණ ක්‍රම, සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම හෝ ආර්ථික පර්යේෂණ ක්‍රම අනුවිෂයය කොටස් ලෙසට හදාරා තිබීම.

(iv) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ හෝ ඉහත සඳහන් එක් ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍ර කිහිපයක තනතුරු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

04. සේවා කොන්දේසි හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසිː-

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 423/12 සහ 1986.10.15 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද හා ඉන් පසුව කරන ලද සංශෝධන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි පන්තියට පත් කරනු ලැබේ.

(ii) තනතුරට පත්කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාව මත මධ්‍යම රජයේ තනතුරුවල හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවල සේවය කළ යුතු ය.

(iii) ඉහත (ii) හි සඳහන් පරිදි පළාත් රාජ්‍ය සේවයට මුදාහරිනු ලබන කාලය තුළ නිලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පාලනය හා විනය පාලනය යටතට ගැනෙනු ඇත. එසේ වුවද සේවයෙන් පහකිරීමේ නියෝගයකට විරුද්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට අභියාචනා කිරීමේ අයිතිය නිලධාරියෙකුට ඇත.

(iv) සාමාන්‍ය සේවක සංඛ්‍යාවට පත්කරනු ලබන තැනැත්තෙකු එසේ පත්කරනු ලැබීමට පෙරාතුව කිසියම් අවස්ථාවක අවම වශයෙන් අවුරුදු 03ක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයකු වශයෙන් සේවය කර නොමැත්තේනම් එසේ පත්කරනු ලැබූ විට වසර තුනක කාලයක් රජයේ පාසලක විදුහල්පතිවරයකු වශයෙන් අනිවාර්යයෙන් ම සේවය කළ යුතු ය. කිසියම් තැනැත්තකු එසේ කර තිබූ කාල සීමාව වර්ෂ 03 කට වඩා අඩුවන අවස්ථාවක දී එසේ පත්කරනු ලැබීමෙන් පසු සම්පූර්ණ කළ යුතු සේවා කාලය කලින් ඔහු විසින් සේවය කළ කාලය හා වර්ෂ 03 ක කාලසීමාව අතර වෙනසට සමාන විය යුතුය.

(v) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත.

05. *වැටුප් ක්‍රමය* -

රු. 22,935 – 10 x 645 - 8 x 790 – 17 x 1050 – රු. 53,555
රු. 24,870 ට පෙර I වැනි කාර්යක්ෂමතා කඩඉම
රු. 26,805 ට පෙර II වැනි කාර්යක්ෂමතා කඩඉම

06. සුදුසුකම් ː-

(අ) මෙම ඡේදයේ අවසානයේ දක්වා ඇති සටහන්වල විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් සුදුසුකම් තිබෙන රජයේ පාසලක හෝ ආධාර ලබන පාසලක හෝ පිරිවෙන් ගුරුවරයකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මසට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

(ඇ) (i) සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ තනතුරු සඳහා :

උපාධියෙන් පසු යටත් පිරිසෙයින් වර්ෂ 05ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධාරී ගුරුවරයකු හෝ අධ්‍යාපන ලේකම් විසින් උපාධියක සම තත්ත්වයේ ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් අයකු වීම/හෝ පුහුණු ගුරු සහතිකය සහිත උපාධිධාරියකු හෝ අධ්‍යාපන ලේකම් විසින් උපාධියක සම තත්වයේ ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් වූ අයකු වීම හෝ පුහුණුවෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක ඉගැන්වීමේ පළපුරුද්ද ලබා ඇති පුහුණු ගුරුවරයෙක් වීම හෝ ගුරුවරයකු වශයෙන් පූර්ණ අවුරුදු 10 ක සේවයක් ඇති පුහුණු ගුරුවරයකු වීම.

*සටහන* - (අභ්‍යාසලාභී පදනම මත ගුරු සේවයට පත් කරන ලද උපාධිධාරී ගුරුවරුන්ගේ පත්වීම් දින සිට සේවා කාලය ද සේවයේ යෙදී සිටිය දී උපාධිය සමත් වූ ගුරුවරුන්ගේ එම උපාධිය සමත් වූ දින සිට සේවා කාලය ද මෙම පස් අවුරුදු සේවා කාලයට ගණන් ගනු ලැබේ.)

(ii) *විශේෂ සේවක සංඛ්‍යාවේ තනතුරු සඳහා* : යටත් පිරිසෙයින් අවුරුදු 3ක්, අයදුම්කරනු ලබන විෂයය ඉගැන්වීමේ හා නියමිත විෂය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිත ගුරුවරයකු හෝ අධ්‍යාපන ලේකම් විසින් සම තත්ත්වයෙහි ලා සලකනු ලබන වෘත්තීය හෝ වෙනත් විභාගයකින් හෝ සමත් අයකු වීම.

*සටහන* - නැටුම්, පෙරදිග සංගීතය, බටහිර සංගීතය, හස්ත කාර්මාන්තය, ශාරීරික අධ්‍යාපනය, චිත්‍ර කර්මය, ගෘහ විද්‍යාව, විශේෂ අධ්‍යාපනය, පිරිවෙන් හා ඉංග්‍රීසි යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අදාළ විෂයය හෝ අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ගුරුවරයකු වශයෙන් අවුරුදු 05කට නොඅඩු සේවයක් ඇති හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හෝ අංක ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළු විෂයන් හයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වූ අපේක්ෂකයකු ද මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබූවකු සේ සලකනු ලැබේ.

07. *වෙනත් සුදුසුකම්* - අපේක්ෂකයා මනා සෞඛ්‍ය අතින් නිසිපරිදි සුදුසුකම් ඇති බවට ද විශිෂ්ඨ චරිතයකින් යුක්ත බවට ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සෑහීමකට පත්විය යුතු ය. මනා ශරීර සෞඛ්‍යයකින් ද, හොඳ ඇස් පෙනීමෙන් ද යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරික සුදුසුකම් තිබිය යුතු ය.

*සැ.යු* - (i) ඉහත සඳහන් පරිදි සේවා කාලය අවුරුදු 03, 05, හෝ 10 අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) හත්(07) වරකට වඩා සීමිත තරග විභාගයට පෙනී සිටීමට කිසිවකුට අවසර නැත. තව ද සීමිත තරග විභාගය සහ විවෘත තරග විභාගය යන විභාග දෙකටම හත් (07) වරකට වඩා පෙනී සිටීමට අවසර නැත.

(iii) අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු සතුටුදායක සේවා කාලයක් නොමැති නම් මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරියකුට කිසිම සුදුසුකමක් නැත.

(iv) මෙම කාලය තුළ කරන ලද වරදකට "අවවාද කිරීම් හැර" කිසියම් දඬුවමක් ලබා නැත්නම් ද (සේවය හෝ දෙපාර්තමේන්තුමය හෝ විභාගයකින් සාමාර්ථ්‍යය ලබා

ගැනීමට නොහැකි වීම පමණක් නිසා වැටුප් වර්ධක ලබා ගැනීමට නොහැකි වීම හේතු කොට ගෙන නිලධාරියකු නුසුදුස්සකු වන්නේ නැත) ඔහුට/ඇයට සතුටුදායක සේවා කාලයක් තිබුණේ යැයි සලකනු ලැබේ.

(v) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියකු මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සකු නොවේ.

08. *විභාග ගාස්තු.*—විභාග ගාස්තු රු. 1000 කි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා විභාග ගාස්තු ගෙවිය යුතුය. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මුදල් තැන්පත් කර ලබා ගන්නා ලද ලදුපත් ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතුය. මෙම ගාස්තු කිසිවක් මොනයම් හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තු වශයෙන් මාරු කිරීමට ද කටයුතු කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ඔබ භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :-

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව තිබිය යුතු අතර 8 1/2" x 11" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් සකස් කළ යුතුය. ආදර්ශ ආකෘතියේ අංක 01 -04 මුල් පිටුවේ ද ඉතිරි ඡේද දෙවන පිටුවේ ද වන ලෙස ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු අතර, ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ඉල්ලුම්පත්‍ර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂා මාධ්‍යයෙන් සකස් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ 1.1, 1.2, 2.1, 2.2 හා 2.3 උප ඡේද ඉංග්‍රීසි (කැපිටල්) අකුරෙන් පිරවිය යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ඇ) ඉහත උපදෙස් පරිදි සකස් කරන ලද ඉල්ලුම් පත්‍රය විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ලියාපදිංචි තැපෑලෙන් "බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ (සංවිධාන හා විදේශ විභාග) විභාග කොමසාරිස් ජනරාල්" නමට 2011 ජනවාරි මස 31 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතුය. පළාත් අධ්‍යාපන කාර්යාලයකට තාවකාලිකව අනුයුක්ත කර ඇති නිලධාරියකු නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ම "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය—2010" යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික නම්වලට එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට අයදුම්කරුට දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත් මගින් ඒ බව නිවේදනය කරනු ලැබේ. එවැනි නිවේදනයක් පිළිබඳ විමසිල්ලෙන් සිටීම වැදගත් වේ. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

10. *විභාගයට පෙනී සිටීම.*—ඉල්ලුම්පත් එවා ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු රීති මාලාවක් ගැසට් නිවේදනයේ ඇතුළත් කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

*සටහන* -

(අ) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ආ) අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.–තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග මධ්‍යස්ථාන ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකු ම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පමණක් පිළිගනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑමකමින් යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. *භාෂා මාධ්‍යය* -

(අ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රජයේ සේවයට ඇතුළත් වීම පිණිස සුදුසුකම් ලබා ගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය.

සටහන -

(i) අපේක්ෂකයකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii) ඉල්ලුම්පතේ සදහන් කර ඇති භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* -

(අ) පහත සදහන් විෂයන් අලලා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රවලින් සමන්විත ලිඛිත විභාගයක් හා සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් වේ.

(i) අවබෝධය—ලකුණු 100යි - කාලය පැය 01 1/2 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය - 01)

(ii) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 යි - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි. ( විෂය අංකය - 02)

(iii) අධ්‍යාපන පරිපාලනය පිළිබඳව සිද්ධි අධ්‍යයනය - ලකුණු 100 යි - පැය 2 ක ප්‍රශ්න පත්‍රයකි. ( විෂය අංකය - 03 )

14. *තෝරාගැනීමේ ක්‍රමය* :

(අ) පත්වීම් දීම සදහා තෝරාගනු ලබන්නේ, ලිඛිත පරීක්‍ෂණයේ එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලබා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවා තනතුර සදහා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් එක් අයකුට වඩා සිටිනම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තීරණයක් ගනු ලැබේ.

(ආ) සුදුසුකම් පරීක්ෂා කිරීම සදහා කැඳවන ලද යම්කිසි අපේක්ෂකයකු හෝ අපේක්ෂකයින් සංඛ්‍යාවක් නියමිත සුදුසුකම් සපුරා නොතිබීමෙන් කිසියම් පුරප්පාඩුවක් ඇති වුවහොත් කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළඟ අපේක්ෂකයින්ගෙන් පුරවනු ලැබේ.

15. විෂය නිර්දේශය (විස්තර) :

(i) අවබෝධය කාලය පැය 1 1/2 යි.

විභාග අපේක්ෂකයාට කෙටි පාඨ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත්ම උචිත ප්‍රකාශය තෝරන ලෙස විභාග අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ. විභාග අපේක්ෂකයා අනෙක් පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීමට හැකිවන පරිදි එම පාඨ සම්බන්ධයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මෙය අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(ii) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 යි.

අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය මැනීම සදහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ.

(iii ) අධ්‍යාපන පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය - කාලය පැය 2 යි.

16. මෙම නිවේදනයේ සදහන් කර නොමැති කරුණු පිළිබඳ අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 17 වැනි දින,
ඉසුරුපාය, බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට/විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2010

Limited Competitive Examination for Recruitment to Class III (General / Special Cadre ) of the Sri Lanka Education Administrative Service - 2010

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට පිටපත් දෙකක් ඉදිරිපත් කරන්න)
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය:

සිංහල - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
විභාගයට පෙනී සිටින ,සේවක සංඛ්‍යාව,

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සාමාන්‍ය සේවක සංඛ්‍යාව - 1
විශේෂ සේවක සංඛ්‍යාව - 2
දෙකටම - 3

ඉල්ලුම් කරන සේවක සංඛ්‍යාව/විශේෂ සේවක සංඛ්‍යාවේ නම් විෂය ක්ෂේත්‍රයේ සංකේත අංකය පහත දැක්වෙන වගුවේ සදහන් කරන්න.(ගැසට් නිවේදනයට අදාළව)

| සේවක සංඛ්‍යාවේ නම | විෂය ක්ෂේත්‍රයේ නම | සංකේත අංකය |
|---|---|---|
| සාමාන්‍ය | | |
| විශේෂ | | |
| විශේෂ | | |

1.0 නම :

1.1 මුල්කුරු අගට යොදා මුල්කුරු සමග නම :————.
(උදාහරණ : Silva , G.A.) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 ස්ත්‍රී පුරුෂභාවය ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.3 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ජනවර්ගය : [ ]

සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5
(අදාළ අංකය කොටුව තුළ සටහන් කරන්න)

3.2 විවාහක/අවිවාහක බව : [ ]
අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය ඃ

වර්ෂය ඃ [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

3.4 2011.0131 වැනි දිනට

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

4.0 අධ්‍යාපන සුදුසුකම් ඃ-
(අ) (i) උපාධිය සමත් වර්ෂය :————.
(ii) හදාරන ලද විෂයන් :————.
(iii) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.

(ආ) (i) පශ්චාත් උපාධිය සමත් වර්ෂය :————.
(ii) හදාරන ලද විෂයන් :————.
(iii) විශ්ව විද්‍යාලය/ආයතනය :————.

5.0 (i) ගුරුවරයකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත් වූ දිනය :————.

(ii) දැනට සේවය කරන අධ්‍යාපන කලාපය :————.

(iii) 2011.01.31 දිනට සේවා කාලය :————.
අවුරුදු :————. මාස :————. දින :————.

6.0 ගුරු පුහුණුව ලත් වර්ෂය :————.

ගුරු විදුහලේ නම :————.

පුහුණු සහතිකය වලංගු වන දිනය :————.

පුහුණුව ලත් විෂය ක්ෂේත්‍රය :————.

පුහුණුවෙන් පසු 2011.01.31 දිනට ඉගැන්වීමේ පළපුරුද්ද :————.

අවුරුදු :————. මාස :————. දින :————.

7.0 ඔබ දැනට දරන තනතුරේ ස්ථිර කරනු ලැබ ඇත්තේ ද යි.

8.0 ඔබ රජයේ සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂාව සඳහන් කරන්න.

09. විභාග ගාස්තු ඃ

| විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මනා ලෙස මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

10. මීට ප්‍රථම මෙම විභාගයට හා විවෘත තරග විභාගයට පෙනී සිටි වාර ගණන :————.

11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත් විභාග ගාස්තු ගෙවන ලද අංක .............. හා ............. වැනි දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුව ද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .............................. පූජ්‍ය/ මහතා/මහත්මිය/මෙනවිය මගේ විද්‍යාලයේ සේවය කරන ගුරුවරයෙකු බව මෙයින් සහතික කරමි.

————,
විදුහල්පතිගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ................... පූජ්‍ය/ මහතා/ මහත්මිය/මෙනවිය මගේ කළාපයේ ...................... විදුහලේ සේවය කරන ගුරුවරයෙකු බවත් 03,05,06,07,08,09 සහ 11 ඡේදවල සඳහන් කරන විස්තර කාර්යාලයේ ඇති ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

දිනය :————.

12-1015/3

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත උසස් කිරීම මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය - 2010**

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියේ තනතුරු පුරප්පාඩු සඳහා ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත සුදුස්සන් තේරීමට තරග විභාගයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ඇත. පහත දැක්වෙන නිවේදනයට අනුකූලව ඒ සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ. ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත සේවයේ III වැනි පන්තියේ පුරප්පාඩුවලින් සියයට තිහකට (30%) නොවැඩි සංඛ්‍යාවක් පත්කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ඇත.

02. *විභාග දිනය සහ ස්ථානය.*—මෙම විභාගය 2011 අප්‍රේල් මස කොළඹ දී පැවැත්වේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

03. *සේවක සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වීමේ දිනය.*—සේවක සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වීමේ දිනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

04. *සේවා කොන්දේසි හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 423/12 සහ 1986.10.15 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1986.03.12 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද ඉන් පසුව කරන ලද සංශෝධනවලටද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරනු ලබන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් සේවයේ III පන්තියට පත් කරනු ලැබේ.

(ii) සේවයට පත් කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(iii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු එකක (01) වැඩ බැලීමේ කාලයකට යටත්වනු ඇත.

05. *වැටුප් ක්‍රමය* -III පන්තිය

රු. 22,935 – 10 x 645 - 8 x 790 – 17 x 1,050 – රු. 53,555
රු. 24,870 ට පෙර I වැනි කාර්යක්ෂමතා කඩඉම
රු. 26,805 ට පෙර II වැනි කාර්යක්ෂමතා කඩඉම

06. සුදුසුකම් :

(අ) මෙම ඡේදයේ අවසානයේ දක්වා ඇති සටහන්වල විධිවිධානයන්ට යටත්ව පහත සඳහන් සුදුසුකම් තිබෙන, දැනට සේවයේ නියුතු නිලධාරියකු ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පත් කරනු ලැබීම සඳහා වන (අභියෝග්‍යතා පරීක්ෂණයට) විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

(i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියේ අවුරුදු 03ක අවම සේවයක් ඇති හා එම සේවයේ ස්ථිර කරන ලද නිලධාරියකු වීම.

(ii) තුන් අවුරුදු සේවා කාලය ගණන් ගනු ලබන්නේ 2011.01.31 වැනි දිනටය.

(iii) සියලුම අයැදුම්කරුවන් සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන.*—2011.01.31 වැනි දිනට පූර්වාසන්න වන අවුරුදු පහක (05) කාලය තුළ යෙදුණ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබෙන සහ ඒ කාලය තුළ විනයානුකූල දඬුවමක් (අවවාද හැර) ලබා නැත්තාවූ නිලධාරියකු පමණක් සතුටුදායක සේවා කාලයක් ඇත්තකු සේ සලකනු ලැබේ. ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියකු මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සකු නොවේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

07. ඉල්ලුම්කිරීමේ ක්‍රමය :

(i) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව කඩදාසියේ දෙපැත්ත ම පාවිච්චි කරමින් අපේක්ෂකයා ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය 2 වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළයුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙන් ම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ 01 සහ 02 කොටුවල උපඡේද ඉංග්‍රීසි අකුරෙන් පිරවිය යුතුය.

(iii) ඉල්ලුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත 2011.01.31 වැනි දිනට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, ඊට පෙර තමා අයත්වන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන ලේකම් වෙත භාරදිය යුතුය. (අපේක්ෂකයින්ගේ පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කර වාර්තාවක් සැපයීමට අවශ්‍ය බැවින්)

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ පෞද්ගලික නම්වලට එවනු ලබන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(vi) ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට අයැදුම්කරුවන්ට දන්වනු නොලැබේ. අයැදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත් මගින් ඒ බව නිවේදනය කරනු ලැබේ. එවැනි නිවේදනයක් පිළිබඳ විමසිල්ලෙන් සිටීම වැදගත් වේ. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(vii) විභාග ගාස්තුව රු. 1000 කි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා විභාග ගාස්තු ගෙවිය යුතුය. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මුදල් තැන්පත් කර ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතුය. මෙම ගාස්තු කිසිවක් මොනයම් හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තු වශයෙන් මාරු කිරීමට ද කටයුතු කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ඔබ භාරයේ තබා ගැනීම ප්‍රයෝජනයත් වනු ඇත.

08. *විභාගයට පෙනී සිටීම* :

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියලුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*සටහන* -

(අ) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ආ) අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - විභාග මධ්‍යස්ථාන ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පමණක් පිළිගනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

09. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්*:-අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වනු ලබන අවස්ථාවේදී හෝ විභාගයට පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑමකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

10. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය වේ.

11. *භාෂා මාධ්‍යය* :—

(අ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රජයේ සේවයට ඇතුළත් වීම පිණිස සුදුසුකම් ලබා ගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත්වල සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයැදුම්කරුවන්ට ඉඩ දෙනු නොලැබේ.

12. *තෝරා ගැනීමේ ක්‍රමය* - ජ්‍යෙෂ්ඨතාව හා අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව මූලික සුදුසුකම් පරීක්ෂා කර බලා පත්වීම් සඳහා තෝරාගනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු | 100 උපරිම |
| අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා ලකුණු | 50 උපරිම |
| මුළු ලකුණු සංඛ්‍යාව | 150 |

(i) **ජ්‍යෙෂ්ඨතාව** : තනතුරට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය බවට 7 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවම සේවා කාලය වන තුන් අවුරුද්ද හැර එම ශ්‍රේණියේ ඉතිරි සතුටුදායක සේවා කාලය ජ්‍යෙෂ්ඨතාව සඳහා ලකුණු දීමට ගණන් ගනු ලැබේ. එක් අවුරුද්දකට ලකුණු අට (8) බැගින් හිමි වන අතර අවුරුද්දකට අඩු සේවා කාලය සඳහා මාස තුනට ලකුණු දෙක (2) බැගින් ලකුණු 100ක උපරිමයකට යටත්ව ලකුණු දීම සිදු කරනු ඇත.

(ii) **අභියෝග්‍යතා පරීක්ෂණය** : විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පැය එකක ප්‍රශ්න පත්‍රයකි. අධ්‍යාපන මූලධර්ම හා අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වන ඵලදායකත්වය සම්බන්ධ ක්‍රියාකාරකම්, පාසල් හා අධ්‍යාපන ආයතන ඇතුළු සංවිධාන සඳහා අවශ්‍යවන සේවක පිරිස් උපරිම ප්‍රයෝජනය ලැබෙන පරිදි ලබා ගැනීම සහ යොදා ගැනීම පිළිබඳ ප්‍රශ්න ඇතුළත් ය.

13. *සුදුසුකම් පරීක්‍ෂා කර බැලීමේ පරීක්‍ෂණයට කැඳවීම* :—

(i) ජ්‍යෙෂ්ඨතාව හා අභියෝග්‍යතා පරීක්‍ෂණය සඳහා ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලින් පිරවීමට අවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයට අදාළ සංඛ්‍යාව පමණක් සුදුසුකම් පරීක්‍ෂාකර බැලීමේ පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ii) සුදුසුකම් පරීක්‍ෂා කිරීම සඳහා කැඳවන ලද යම්කිසි අපේක්‍ෂකයකු හෝ අපේක්‍ෂකයින් සංඛ්‍යාවක් නියමිත සුදුසුකම් සපුරා නොතිබීමෙන් යම්කිසි පුරප්පාඩුවක් ඇතිවුවහොත් කුසලතා අනුපිළිවෙල අනුව ලේඛනයේ ඊළඟ අපේක්‍ෂකයින්ගෙන් ඒවා පුරවනු ලැබේ.

(iii) සමාන ලකුණු ලබා ඇති අපේක්‍ෂකයින් එක් අයකුට වඩා සිටී නම් ඒ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණයක් ගනු ලැබේ.

(iv) මෙහිදී අපේක්‍ෂකයින්ගේ යෝග්‍යතාව පරීක්‍ෂා කර බලන අතර ලකුණු දීමක් සිදු නොකෙරේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 17 වැනි දින,
'ඉසුරුපාය', පැලවත්ත, බත්තරමුල්ල
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයැදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත උසස් කිරීම මගින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට පත්කිරීම සඳහා ඉල්ලීම - 2010

Competitive Examination for Recruitment to Class III of the Sri Lanka Education Administrative Service on the Basis of Seniority and Merit - 2010

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 (i) මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 (i) වර්තමාන සේවා ස්ථානය හා කාර්යාලයීය ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) පෞද්ගලික ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 (i) ස්ත්‍රී/පුරුෂභාවය

ස්ත්‍රී - 1
පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

(ii) ජනවර්ගය

(අදාළ අංකය කොටුව තුළ සටහන් කරන්න).

සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

(iii) ජාතික හැඳුනුම්පත් අංකය :

04. (i) උපන් දිනය :

වර්ෂය මාසය දිනය

(ii) 2011.01.31 දිනට වයස

අවු. මාස දින

(iii) විවාහක අවිවාහක බව :

අවිවාහක - 1
විවාහක -2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 සේවා විස්තර :-

(i) මුල් පත්වීමේ තනතුර හා පත්වීමේ දිනය :—————.

(ii) දැනට ඔබ අයත්වන පළාත් අධ්‍යාපන කාර්යාලය/කලාප අධ්‍යාපන කාර්යාලය :—————.

(iii) විදුහල්පති I ශ්‍රේණියට පත් වූ දිනය :—————.

6.0 අධ්‍යාපන සුදුසුකම් :—————.

7.0 වෘත්තීය සුදුසුකම් :—————.

8.0 සහභාගි වී ඇති පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර :—————.

9.0 2011.01.31 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ කළ වරදකට ලැබූ කවර ආකාරයේ හෝ (අවවාද කිරීම් හැර) දඬුවම් පිළිබඳ විස්තර :—————.

10.0 (i) 2011.01.31 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ දී සියලු වැටුප් වර්ධකයන් උපයාගෙන තිබේ ද ? :—————.

(ii) උපයාගෙන නොතිබේ නම් ඊට හේතු :—————.

11. ඔබට විරුද්ධව දැනට කිසියම් විනයානුකූල පරීක්ෂණයක් පවත්වමින් තිබේ නම් එහි වර්තමාන තත්ත්වය. :—————.

12. පසුගිය වර්ෂ 05 තුළ වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :—————.

ඉහත සඳහන් කර ඇති විස්තර අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවමත උසස් කිරීම සඳහා සළකා බැලීමට මා සුදුසු බවත් මෙම ඉල්ලුම්පත්‍රයේ මා සපයා ඇත්තාවූ තොරතුරු නිවැරැදි බවත් ප්‍රකාශ කර සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————.
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :—————.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ඉහත 06 සිට 12 දක්වා සඳහන් කර ඇති සේවා විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරැදි බවට සහතික කරමි. තව ද නියමිත විභාග ගාස්තුව රු. 1,000 ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බව ද සහතික කරමි.

—————,
කලාප අ. අ./පළාත් අ. අ./පළාත් අ. ලේ.

දිනය :—————.

| විභාග ගාස්තු රු. 1,000 ගෙවා ලබාගත් ලදුපත මනා ලෙස මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |
|---|

12-1015/1

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට/විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ තනතුරු පුරප්පාඩු පිරවීමට විවෘත තරග විභාගයක් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලැබේ. පහත දැක්වෙන නිවේදනයට අනුකූලව ඒ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. විවෘත තරග විභාග ප්‍රතිඵල මත සේවයේ III වන පන්තියේ පුරප්පාඩුවලින් සියයට විසිපහකට (25%) නොවැඩි පුරප්පාඩු සංඛ්‍යාවකට පත්කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ඇත.

02. මෙම නිවේදනයේ "ලේකම්" යන්නෙන් අදහස් කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ය. "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයයි. "ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

03. *විභාග පරිපාටිය.*—මෙම විභාගය පවත්වනු ලබන්නේ I වන කොටස හා II වන කොටස වශයෙන් කොටස් දෙකකිනි.

I වන කොටස

*පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තය.*

(i) අවබෝධය—ලකුණු 100 යි—කාලය පැය 01 1/2 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 01)

(ii) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 යි - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 02)

සියලුම අපේක්ෂකයින් මෙම පළමු වන කොටසට පෙනී සිටිය යුතුය. විභාගයේ I වන කොටස 2011 අප්‍රේල් මාසයේ දී පැවැත්වේ. විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

II වන කොටස

*පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.*

(i) සාමාන්‍ය දැනීම - ලකුණු 150 යි—පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි. (විෂය අංකය 03)

(ii) වාක්‍ය රචනය - ලකුණු 100 යි—පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි (විෂය අංකය 04)

විභාගයේ II වැනි කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ විභාගයේ I වැනි කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් අවම වශයෙන් 60% ක් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණි. I වැනි කොටසෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයින් වෙත විභාගයේ II වැනි කොටස පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ලැබේ. විභාගයේ II වන කොටස සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40 % බැගින් ලබා ගත යුතු ය.

04. *සම්මුඛ පරීක්ෂණය.*-සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ සුදුසුකම් සහතික හා මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ලිඛිත විභාගයේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

05. *සේවක සංඛ්‍යාව හා පත් කිරීමේ දිනය*

(i) සේවයේ III වැනි පන්තියේ සේවක සංඛ්‍යාව "සාමාන්‍ය" සේවක සංඛ්‍යාවකින් සහ "විශේෂ" සේවක සංඛ්‍යාවකින් සමන්විත වේ. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

(ii) සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අමතරව විශේෂ සේවක සංඛ්‍යාව යටතේ වූ පහත III වන ඡේදයේ (ආ) හි සඳහන් ක්ෂේත්‍රයන් හි පුරප්පාඩු සඳහා ද අයදුම් කළ හැකිය. එක් අපේක්ෂකයෙකුට

සාමාන්‍ය සේවක සංඛ්‍යාවට සහ විශේෂ සේවක සංඛ්‍යාවට අදාළ තවත් ක්ෂේත්‍ර දෙකකට අයදුම් කළ හැකිය. විශේෂ සේවක සංඛ්‍යාව යටතේ අයදුම් කරනු ලබන්නේ නම් එහි දී ඉල්ලුම් කරන විෂයය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන මුළු විෂය ඒකක/සම්භාර සංඛ්‍යාවෙන් 1/3 ක් වත්, අයදුම් කරන විෂයයට අදාළ වන විෂයයන් විය යුතුය. සැලසුම් හා විශේෂ අධ්‍යාපන විෂයයන් සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනම දක්වා ඇත.

(iii) විෂය ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක පහත සඳහන් වන අතර තමා අයදුම්කරනු ලබන ක්ෂේත්‍රයන් හා ඊට අදාළ සංකේත අංක අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය.

සංකේත අංකය

(අ) සාමාන්‍ය සේවක සංඛ්‍යාව 11

(ආ) විශේෂ සේවක සංඛ්‍යාව

| *විෂය ක්ෂේත්‍රය* | *සංකේත අංකය* |
|---|---|
| ඉංග්‍රීසි | 21 |
| ගණිතය | 22 |
| විද්‍යාව | 23 |
| චිත්‍ර කලාව | 24 |
| සංගීතය (පෙරදිග) | 25 |
| සංගීතය (අපරදිග) | 26 |
| නැටුම් | 27 |
| කෘෂි විද්‍යාව | 28 |
| වාණිජ විද්‍යාව | 29 |
| විශේෂ අධ්‍යාපන | 30 |
| සැලසුම් | 31 |
| අරාබි | 32 |
| තොරතුරු තාක්ෂණය | 33 |

*සැ. යු.*:- විවෘත තරග විභාගය යටතේ විශේෂ සේවක සංඛ්‍යාවේ විශේෂ අධ්‍යාපනය යන විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත්ව තිබිය යුතු ය. :-

ඌනතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය (විශේෂ අධ්‍යාපනය) සම්බන්ධයෙන් පිරිනැමෙන අධ්‍යාපනවේදී උපාධි සහතිකය, විශේෂ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය, විශේෂ අධ්‍යාපන පිළිබඳ අධ්‍යාපනපති හෝ ශාස්ත්‍රපති උපාධි සහතිකය

විශේෂ සේවක සංඛ්‍යාවේ සැලසුම් විෂයය සඳහා ඉල්ලුම් කරන්නේ නම් පහත දැක්වෙන උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ඉන් සමත්ව තිබිය යුතුය.—

සංඛ්‍යාන විද්‍යාව උපාධියට විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් වෙනත් විෂයයක අනු විෂයය ක්ෂේත්‍රයක් වශයෙන් හදාරා තිබීම.;

ගණිතය උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂය ක්ෂේත්‍රයට අනු විෂයයක් වශයෙන් හදාරා තිබීම.;

කළමනාකරණ හා සැලසුම් ශිල්ප ක්‍රම උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂයන්ට අයත් අනු විෂයයක් ලෙසට හදාරා තිබීම;

අධ්‍යාපන විද්‍යාව, මූලධර්ම හා තුලනාත්මක අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍ර උපාධි විෂයයක් ලෙසට හෝ උපාධියට අයත් විෂයයන්ගේ අනුවිෂයයක් ලෙසට හදාරා තිබීම;

සමාජ විද්‍යාව උපාධි විෂයයක් වශයෙන් හෝ උපාධියට අයත් විෂයයක අනු විෂයයක් ලෙසට හදාරා තිබීම;

ජෛවීය විද්‍යා හෝ භෞතිය විද්‍යා උපාධි විෂයන් සමග සංඛ්‍යානය හෝ පර්යේෂණ කටයුතු උපාධි අනු විෂයයකට අයත් විෂය කොටස් ලෙසට හදාරා තිබීම;

පිරිවැයකරණය හා ආර්ථික මූලධර්ම උපාධි විෂයයන් සමග උපාධියට අයත් විෂයන්ට පිරිවැය විශ්ලේෂණ ක්‍රම, සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම හෝ ආර්ථික පර්යේෂණ ක්‍රම අනුවිෂයය කොටස් ලෙසට හදාරා තිබීම.

(iv) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහත සඳහන් එක් ක්ෂේත්‍රයක් හෝ ක්ෂේත්‍ර කිහිපයක් සඳහා වූ තනතුරු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

06. *සේවා කොන්දේසි හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 423/12 සහ 1986 ඔක්තෝබර් මස 15 වන දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1986.03.12 වෙනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද ඉන් පසුව කරන ලද සංශෝධනවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි පන්තියට පත් කරනු ලැබේ.

(ii) තනතුරට පත්කරනු ලබන නිලධාරීන් සේවයේ අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම තැනක සේවක කළ යුතු ය.

(iii) මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ හෝ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වනු ඇත.

(iv) සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ තෝරාගනු ලබන අපේක්ෂකයින් තම සේවා කාලය තුළ අවුරුදු 03 ක් විදුහල්පතිවරයෙකු වශයෙන් 1AB/1C පාසලක අනිවාර්යෙන් ම සේවය කළ යුතු ය.

07. *වැටුප් ක්‍රමය*-

රු. 22,935 - 10 x 645 - 8 x 790 -17 x 1,050 - රු. 53,555
රු. 24,870 - ට පෙර I වැනි කාර්යක්ෂමතා කඩඉම
රු. 26,805 ට පෙර II වැනි කාර්යක්ෂමතා කඩඉම

08 සුදුසුකම්

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය,

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබිය යුතු ය. නැතහොත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් යටත් පිරිසෙයින් ඒ හා සම මට්ටමෙහිලා සලකන යම් වෘත්තීය හෝ වෙනත් විභාගයකින් සමත් වී සිටිය යුතු ය.

(ඇ) 2011.01.31 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

සටහන :

(i) සාමාර්ථය ලැබීම පිණිස අවශ්‍ය වන විභාගය හෝ විභාග 2011.01.31 දින වන විට සෑම ආකාරයකින් ම සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත්නම් ද; හා

(ii) උපාධිය වෘත්තීය හෝ වෙනත් විභාග පිළිබඳ නිල සහතිකය හෝ එම සහතිකයක් වෙනුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළිගන්නා වූ නිල ලේඛනයක් හෝ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇත්නම් පමණක් ද අපේක්ෂකයෙකු උපාධියක් හෝ වෘත්තීයමය හෝ අවශ්‍ය මට්ටමේ වෙනත් විභාගයකින් හෝ සාමාර්ථය ලැබී ඇතැයි සළකනු ලැබේ.

(iii) තුන් වරකට වඩා මෙම විභාගයට පෙනී සිටීමට කිසිවකුට අවසර නැත.

09. *වෙනත් සුදුසුකම්.-* අපේක්ෂකයා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටින බව ද විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද අධ්‍යාපන අමාත්‍යාශයේ ලේකම් සෑහීමකට පත්විය යුතු ය. මනා ශරීර සෞඛ්‍යයකින් ද හොඳ ඇස් පෙනීමෙන් ද යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරික සුදුසුකම් තිබිය යුතු ය. තෝරාගනු ලබන අපේක්ෂකයා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

10. *විභාග ගාස්තු* - විභාගය සඳහා වූ ගාස්තු මෙසේය.

I වැනි කොටස රු. 600 යි. :

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා විභාග ගාස්තු ගෙවිය යුතු ය. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මුදල් තැන්පත් කර ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතු ය. මෙම ගාස්තු කිසිවක් මොනයම් හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයක ගාස්තු වශයෙන් මාරු කිරීමට ද කටයුතු කරනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ඔබ භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II වැනි කොටස රු. 400 යි. :

විභාගයේ දෙවන කොටස සඳහා ගාස්තු ගෙවිය යුතු ආකාරය එම කොටසට පෙනී සිටීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් පසුව දැනුම් දෙනු ඇත.

11. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත යුතු ය. 1-4 වැනි කොටස් කඩදාසියේ 1 වැනි පිටුවේ ද 5 සිට ඉතිරි කොටස් අනෙක් පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු අතර, ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2011.01.31 දිනට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට එවිය යුතු ය. :—

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
පැලවත්ත,
බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍ර බහා ඇති කවරයේ ඉහළ වමත් පස "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම පිණිස වන විවෘත තරග විභාගය — 2010" යන්න පැහැදිලිව ලිවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඇ) අයැදුම්පතෙහි 1:1, 1: 2, 2: 0, 2: 2 ඡේද ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය.

(ඈ) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙන් සකස් කළ යුතු ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥයකු හෝ රු. 1,28,160 නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියකු විසින් අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු ය.

(උ) අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික නම්වලට එවනු ලබන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඌ) ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට අයැදුම්කරුට දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

12. *විභාගයට පෙනී සිටීම* :

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියලුම අපේක්ෂයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂයෙකු විභාග ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය

ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු රීති මාලාවක් *ගැසට් නිවේදනයේ* ඇතුළත් කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

*සටහන.*—අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(අ) *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පමණක් පිළිගනු ඇත. :

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

14. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව අවසන් තීරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණයවේ.

15. *භාෂා මාධ්‍යය* :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම සේවය සඳහා සුදුසුකම්ලත් විභාගයෙන් සාමාර්ථය ලැබූ මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා මාධ්‍ය දෙකින් හෝ වැඩි ගණනකින් සමත් වී ඇත්නම් එම විභාගයේ දී ඔහු/ඇය සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදා ගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂා මාධ්‍යයකිනුත්, අතිරේක විෂයය තවත් භාෂා මාධ්‍යයකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයෙන් සාමාර්ථයලත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඉ) සෑම ප්‍රශ්න පත්‍රයකට ම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි.

(ඊ) ඉල්ලුම්පත්‍රයේ සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

*සටහන.*—ඉහත "අ" හා "ඇ" හි සුදුසුකම් ලැබූ විභාගය යනුවෙන් සඳහන් වන්නේ 8(ආ) වැනි ඡේදයේ සඳහන් විභාගය වේ.

16. *තෝරාගැනීමේ ක්‍රමය* :

(අ) පත්කිරීම පිණිස තේරීම කෙරෙන්නේ විභාගයේ I වැනි හා II වැනි කොටස්වලට පෙනී සිටියා වූ ද, විභාගයේ I වැනි හා II වැනි කොටස එකට ගත් කළ ඒ සඳහා ඉහළම ලකුණු සංඛ්‍යාව ලබාගත්තා වූ ද අයගෙනි. සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයින් එක් අයෙකුට වඩා සිටී නම් ඒ ගැන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණයක් ගනු ලැබේ.

(ආ) ලිඛිත විභාගවල දී වැඩිම ලකුණු ලබා ගත් කුසලතා අනුපිළිවෙලින් පිරවීමට අවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයට අදාළ සංඛ්‍යාව පමණක් සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ඇ) සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවන ලද යම් කිසි අපේක්ෂකයෙකු හෝ අපේක්ෂකයින් සංඛ්‍යාවක් නියමිත සුදුසුකම් සපුරා නොතිබීමෙන් යම්කිසි පුරප්පාඩුවක් ඇතිවුවහොත් කුසලතා අනුපිළිවෙල ලේඛනයේ ඊළඟ අපේක්ෂකයින්ගෙන් ඒවා පුරවනු ලැබේ.

17. *විෂය නිර්දේශය* :

*I කොටස*

(i) *අවබෝධය.*—විභාග අපේක්ෂකයාට කෙටි පාඨ කිහිපයක් ඉදිරිපත් කරනු ලැබේ. ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ කිහිපයක් ඉදිරිපත් කෙරේ. ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට ඉතා හොඳින් ගැලපෙනු ඇත. වඩාත් උචිත ප්‍රකාශය තෝරන ලෙස අපේක්ෂකයාට උපදෙස් දෙනු ලැබේ. අපේක්ෂකයා මෙම පාඨවල අදහස් වටහා ගන්නා අන්දම පරීක්ෂා කළ හැකිවන පරිදි ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මෙය අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(ii) *බුද්ධි පරීක්ෂණය.*—අපේක්ෂකයාගේ තර්කන ශක්තිය පිළිබඳව සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.

*II කොටස*

(i) *සාමාන්‍ය දැනීම.*—ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජීය සංස්කෘතික, ආර්ථික පරිසරය ද ඇතුළුව අපේක්ෂකයා ජීවත් වන හා වැඩ කරන පරිසරය පිළිබඳ දැනුම මැනීමට සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික වර්ධනය පිළිබඳව ද අපේක්ෂකයින් දැන සිටිය යුතු ය. ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

(ii) *වාක්‍ය රචනය.*—නා නා විෂයයන් අතුරෙන් තෝරා ගන්නා ලද විෂයයන් තුනක් ගැන වාක්‍ය රචනා තුනක් ලිවීම අපේක්ෂා කෙරේ. මෙම විෂයයන් එක් විශේෂ අධ්‍යයන ක්ෂේත්‍රයකට සම්බන්ධ නොවන අතර, අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම හා බුද්ධිය, සාමාන්‍ය කල්පනා කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ඇත. වාක්‍ය රචනාවල තත්ත්වය නිශ්චය කරනුයේ විෂයය පිළිබඳව ඇති නිර්මාණ ශක්තිය හා කල්පනා ශක්ති ප්‍රමාණය මෙන්ම ඒවා ඉදිරිපත් කරන ආකාරය ද අනුවය.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 17 වැනි දින,
ඉසුරුපාය,
බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයැදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට (සාමාන්‍ය සේවක සංඛ්‍යාවට/විශේෂ සේවක සංඛ්‍යාවට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2010

Open Competitive Examination for Recruitment to Class III (Ordinary Service Category/Special Service Categary) of the Sri Lanka Education administrative Service - 2010

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල -2
දෙමළ - 3
ඉංග්‍රීසි -4

විභාගයට පෙනී සිටින "සේවක සංඛ්‍යාව"

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සාමාන්‍ය සේවක සංඛ්‍යාව - 1
විශේෂ සේවක සංඛ්‍යාව - 2
දෙකටම - 3

ඉල්ලුම් කරන සේවක සංඛ්‍යාව/විශේෂ සේවක සංඛ්‍යාවේ නම් විෂය ක්ෂේත්‍රයේ සංකේත අංකය පහත දැක්වෙන වගුවේ සඳහන් කරන්න. (ගැසට් නිවේදනයට අදාළව)

| සේවක සංඛ්‍යාවේ නම | විෂය ක්ෂේත්‍රයේ නම | සංකේත අංකය |
|---|---|---|
| සාමාන්‍ය | | |
| විශේෂ | | |
| විශේෂ | | |

1.0 නම :

1.1 මුල්කුරු අගට යොදා මුල්කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදාහරණ : SILVA, G. A.)

1.2 ස්ත්‍රී පුරුෂ භාවය ස්ත්‍රී - 1
පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.3 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 ස්ථිර ලිපිනය :—————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ජනවර්ගය :
සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

(අදාළ අංකය කොටුව තුළ සටහන් කරන්න.)

3.2 විවාහක/අවිවාහක බව
අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.4 2011.01.31 දිනට වයස :

අවුරුදු මාස දින

4.0 මෙම තනතුර සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය, සමත් වූ භාෂා මාධ්‍යය :—————.

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 උපාධිය හෝ වෙනත් සුදුසුකම් ලද දිනය :—————.
(කරුණාකර ගැසට් නිවේදනයේ 8 (ආ) හොඳින් කියවා බලන්න.)

5.2 විශ්ව විද්‍යාලය/ආයතනය :—————.

5.3 විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි අංකය :—————.

5.4 බාහිර/අභ්‍යන්තර :—————.

5.5 උපාධිය :—————.

5.6 විෂයයන් :—————.

5.7 පන්තිය :—————.

5.8 ඉහළ/පහළ :—————.

5.9 විභාග අංකය :—————.

5.10 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

6.0 1991, 2002, 2005 වර්ෂවලදී පවත්වන ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගවලට පෙනී සිටියේ ද යන්න සඳහන් කරන්න.

7.0 විභාග ගාස්තු :

විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත මනා ලෙස මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

8.0 මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ වැනි දින දරන ලදුපත මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව වුව ද නුසුදුසු බව පෙනී ගියහොත් මා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කිරීම

මෙහි අත්සන් කරන ලද ... හි පදිංචි... මයා/මිය/මෙනවිය මම පුද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් ඔහු/ඇය ගේ අත්සන මා ඉදිරිපිට දී තැබූ බවත්, සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

12-1015/2

---

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2010 (2011)**

1.0 2009.09.24 වැනි දින හා අංක 1620/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2011 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාග ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත. තව ද, පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප* :— අංක 06/2006 (iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට අදාළ වැටුප් කාණ්ඩය MN3-2006-A වන අතර මාසික වැටුප් පරිමාණය රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ.

*සටහන* :- පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යෙදෙන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

4.0 *සේවා කොන්දේසි* :-

(i) සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III පන්තියට පත්කරනු ලබන නිලධාරියෙකු වසරක වැඩ, බැලීමේ කාලයකට යටත් වේ. වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වීම යන කරුණු සම්පූර්ණ වීම මත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලධාරියකු සිය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(iii) පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර අංක 07/2007 හා 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතායක් ලබා ගත යුතුය.

5.0 *සුදුසුකම්* .- මෙම විභාගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(අ) රාජ්‍ය සේවයේ පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම සහ අයැදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.);

සහ

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමුවන වසර සමත්ව තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමුවන වසර සමත්ව තිබීම.

*සටහන* :-

1. සෑම අයැදුම්කරුවෙකුම තනතුරට අදාල සියලු සුදුසුකම් 2011 ජනවාරි මස 31 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

2. ඉහත 5.0 (අ) ඡේදයේ පරිදි පහත (අ) (ආ) හි සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයට අයැදුම් කිරීමට සුදුසු සේ සැලකේ.

(අ) 2011.01.31 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුලදී ලැබෙන සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

(ආ) 2011.01.31 වැනි දිනට පෙර වර්ෂ 05 ක් තුළදී කිසිදු විනයානුකුළ දඬුවමකට යටත් කර නොතිබීම (අවවාද කිරීම් හැර)

6.0 විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | පුස්තකාල විද්‍යාව | 100 යි | පැය 03 යි |
| (ii) | බුද්ධි පරීක්ෂණය | 100 යි | පැයි 01 යි |
| (iii) | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |

ඉහත විෂයයන්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ :-

6.1 **පුස්තකාල විද්‍යාව**

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය :

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය
(ආ) පුස්තකාලයන්හි සාමාජික කාර්යභාරය
(ඇ) පොත් සහ විවිධ ලේඛන, හා ලේඛන මුද්‍රිත නොවන මාධ්‍යයන් හි ආරම්භය හා විකාශය
(ඈ) විද්වත් වෘත්තීය සංගම්
i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
ii. ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්
(ඉ) පුස්තකාල වර්ග
i. පාසැල් සහ විද්‍යායතන පුස්තකාල
ii. රජයේ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල
iii. මහජන පුස්තකාල
(ඊ) පුස්තකාල කමිටු
(උ) සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

(2) දැනුම සහ තොරතුරු සංවිධානය :

(අ) ග්‍රන්ථ වර්ගීකරණය, එහි අරමුණු, ප්‍රයෝජන
(ආ) ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග
(ඇ) දශම වර්ගීකරණය
(ඈ) සුචිකරණය, එහි අරමුණු
(ඉ) AACR 2 සුචිකරණ නීති සංග්‍රහය
(ඊ) සංලේඛය හා ග්‍රන්ථ විස්තරය
(උ) සුචි වර්ග

(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා :

(අ) විවිධ පුස්තකාල සම්පත්
(ආ) පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය
(ඇ) ප්‍රතිග්‍රහණය සහ ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
(ඈ) පිරිසැකසුම්කරණය
(ඉ) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)

(අ) පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම්

6.2 **බුද්ධි පරීක්ෂණය**

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

6.3 **සාමාන්‍ය දැනුම**

ජාතික, කලාපීය සහ සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂයය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ විභාග වර්ගීකරණය යටතේ III වැනි ක්ෂේත්‍රයට අදාළව සකස් වේ.)

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් වත් (40%) අපේක්ෂයෙකු විසින් ලබාගත යුතු වන අතර සීමිත තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

7.0 *විභාග ගාස්තු.*—විභාග ගාස්තුව රු. 400 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟතබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

8.0 *අයදුම්පත්‍ර.*—ඒ 4 (සෙ.මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් ම අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

8.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.2 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු

ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය - 2010 (2011)" යන්න සඳහන් කරන්න.

9.0 අයදුම්පත නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කර තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් 2011.01.31 වැනි දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර, ඒ සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

10.0 විභාගයට පෙනී සිටීම.—අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහිතක කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

11.0 පත්වීම සඳහා අයදුම්කරු තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය. අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

13.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*—ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුස බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය ඕනෑම අවස්ථාවක රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

14.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තවද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2010 (2011)

Limited Competitive Examination for Recruitment to Class III of Sri Lanka Government Librarians' Service - 2010 (2011)

(දෙන ලද කොටු තුළ නිවැරදි අංකය පැහැදිලිව සටහන් කරන්න)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Perera A. B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය
(සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී -1
පුරුෂ -0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :

වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

4.0 සේවා විස්තරය :

4.1 ඔබ දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ නම :—————.
4.2 දැනට දරන තනතුරේ පදවි නාමය :—————.
4.3 දැනට දරන තනතුරට පත් වූ දිනය :—————.
4.4 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේ ද යන වග :—————.
4.5 සේවය ස්ථිර කර තිබේ නම් ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය :—————.
4.6 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :—————.

5.0 අධ්‍යාපන සුදුසුකම් : විභාග නිවේදනයේ 5.0 (ආ) ඡේදය ප්‍රකාර මෙම විභායට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා ඔබ පළමුවන වසර සමත් වී ඇති තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ විස්තර

(i) විශ්ව විද්‍යාලය/ :—————.
ආයතනය
(ii) ඩිප්ලෝමා පාඨමාලාවේ :—————.
නම
(iii) පළමුවන වසර සමත් වූ :—————.
වර්ෂය

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.

(ii) ලදුපත් අංකය හා දිනය :—————.

(iii) ගෙවූ මුදල :—————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න) |

7.0 අයැදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————.
අයැදුම්කරුගේ අත්සන

දිනය :—————.

**අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

1. මෙම අයැදුම්කරු/අයැදුම්කාරිය වන.... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බව ද,

2. ඔහු/ඇය රජයේ පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරක ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි 2011.01.31 වැනි දිනට හෝ පෙර වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සපුරා ඇති බව ද,

3. පුස්තකාල සහායක/පුස්තකාල සේවක තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,

4. ඔහු/ඇය 2011.01.31 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව ද,

5. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම අනුව 2011.01.31 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත වූ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබුණු බව ද,

6. ඔහුගේ/ඇයගේ 2011.01.31 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ දී ලැබෙන සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබෙන බව ද,

7. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලැබෙන බව ද,

8. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග සසැඳෙන බව ද, විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*සංලක්ෂය* :-

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. අයදුම්පතෙහි අඩංගු කරුණු සෑම අයුරකින් ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමට පත්විය යුතුය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

12-1117

---

**පරිසර අමාත්‍යාංශය**

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

*ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරි (දෙමළ මාධ්‍ය) තනතුරුවලට බඳවා ගැනීම - 2010*

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරි (දෙමළ මාධ්‍ය) තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *වැටුප් ක්‍රමය*.-

(i) පුහුණු කිරීමේ ශ්‍රේණිය ඃ MN ඃ 1-2006 A රා.ප.ච. ලේඛ 06/2006 (iv) අනුව රු. 13,120 x 1 x 145 රු. 13,265

(ii) II ආ පන්තිය ඃ MN ඃ 3 : 2006 A (රා.ප.ච. ලේඛ 07/2006 අනුව) රු. 15,005 x 180 x 4 - 240 x 6 - රු. 17,165

3. *සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි*.-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iii) බඳවා ගනු ලබන්නේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ය.

(iv) අඩවි වන නිලධාරීන්ගේ සේවා ස්ථාන දිවයිනේ වන ගත ප්‍රදේශවල පිහිටි, දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු අතර, බඳවා ගැනීමේ සිට අවම වශයෙන් වසර 05ක් අනිවාර්යයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් තුල සේවය කල යුතුය.

(v) ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සහ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අඩවි වන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ (සංශෝධිත) වගන්ති අදාලවනු ඇත.

(vi) *ගැසට් පත්‍රයේ* (II අ) ඡේදය ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළවන පොදු කොන්දේසි අදාල වේ.

(vii) විභාගය පැවැත්වෙන්නේ දෙමළ මාධ්‍යයෙන් පමණි.

4. *වයස් සීමාව*.- ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනුයුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවනු ඇත.

5. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*.- සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය. :-

i. සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 2ක් ඇතුළත්ව විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වී තිබිය යුතුය.;

හෝ

අධ්‍යාපන නව විභාග පරිපාටිය යටතේ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වී තිබිය යුතුය.; හා

ii. භාෂාව හෝ සාහිත්‍යය, අංක ගණිතය/ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබිය යුතුය.

iii. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම උස ප්‍රමාණය අඩි 05 අඟල් 02 ද පපුව අඟල් 32ක් ද විය යුතුය. (පපුවේ ප්‍රමාණය කාන්තා අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.)

iv. අයදුම්කරුවන් මනා චරිතයකින් යුක්ත විය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය*.-

(i) ඉහත 05 ඃ ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකින් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, සම්මුඛ පරීක්ෂණයකට ලක් කිරීමෙන් පසුව, පවත්නා/නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස තෝරා ගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්ට ලකුණු ලබා දෙනු නොලැබේ.)

(ii) ඉහත 6.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින්, සේවක සංඛ්‍යාවෙන් පිටත පවතින පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරන අතර, අදාළ විෂයය නිර්දේශය අනුව වන විද්‍යායතනයේ දී ලබා ගන්නා වසර දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට විභාගය සමත් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ඛණ්ඩයට ඇතුළත් කෙරේ.

(iii) ඉහත 6.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් අතරින්, රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) ලබා ඇති අයදුම්කරුවන්, නුවරඑළිය වන විද්‍යායතනයේ එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු II පන්තියේ 'ආ' ඛණ්ඩයට පත්කරනු ලැබේ.

(iv) ඉහත 6.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් අතරින්, රජයේ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑඅවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී අදාළ සහතික ලබා ඇති අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II 'ආ' ඛණ්ඩයට බඳවා ගනු ලැබේ.

(v) ඉහත 6. (i) සහ 6. (iv) යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයට බැඳී වසර 05ක් ඇතුළත ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාල විභාගය සමත් වීම අනිවාර්ය වේ.

7. *විෂය නිර්දේශය.-* ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. :-

(i) *බුද්ධි පරීක්ෂණය.-* කාලය පැය 01. ලකුණු සංඛ්‍යාව 100.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ කෙටි හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

(ii) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය.-*කාලය පැය 02. ලකුණු සංඛ්‍යාව 100.

මෙම ප්‍රශ්න පත්‍රය අර්ධ ව්‍යුහගත හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය.

*විෂය නිර්දේශය* :

(*a*) වන සම්පත් කළමනාකරණය හා උපයෝගීතාවය සම්බන්ධ කාර්යයන් පිළිබඳ අවබෝධය,
(*b*) ශ්‍රී ලංකාවේ පාරිසරික දැනුවත් බව, භූගෝලීය වැදගත්කම පිළිබඳ අවබෝධය,
(*c*) ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය පිළිබඳව වූ දැනුම,
(*d*) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වැදගත් තොරතුරු, එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය,
(*e*) වන සම්පත හා පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම,
(*f*) වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාවය හා එහි වැදගත්කම පිළිබඳ අවබෝධය,
(*g*) උද්භිත විද්‍යාත්මක මූලික දැනුම හා භූගෝලීය විද්‍යාත්මක මූලික දැනුම,
(*h*) සාමාන්‍ය දැනුම මැන බැලීම.

(iii) අපේක්ෂකයින් මෙකී ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි.

8. *අයදුම්පත් හා අනෙකුත් විස්තර* :

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21x29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල තමන් විසින් ඉල්ලුම් පත සකස්කළ යුතු අතර, ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, "අඩවි වන නිලධාරී (දෙමළ මාධ්‍ය) තනතුරට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කර 2011.02.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතුය.)

(ii) අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ ලැබෙන ඉල්ලුම් පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

(iv) ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමාදාන විනිශ්චයකාරවරයකු හෝ යුධ, නාවික, ගුවන්, හමුදා අධිකාරී බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු හෝ තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරිවරයා විසින් සහතික කරනු ලැබිය යුතුය.

(v) මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) රජයේ සේවයේ අනුයුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, සුදුස්සකු වශයෙන් තේරී පත් වුවහොත් එම දෙපාර්තමේන්තුවේ සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සඳහන් කළ යුතුය.

(vii) ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

9. *විභාග ගාස්තු* :

(i) විභාග ගාස්තුව රු. 300.00කි. 'වන සංරක්ෂක ජනරාල්ගේ 'පොදු තැන්පත් ගිණුමට' බැර වන ලෙස, දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ඉහත මුදල ගෙවා, ලබාගත් මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසු ය.).

(ii) කුමන කරුණක් යටතේ වුව ද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

10. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය. :-

(i) *උප්පැන්න සහතිකය;*

(ii) *අධ්‍යාපන සහතික;*

(iii) මැතක දී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව);

(iv) චරිත සහතික දෙකක්;

(v) වෙනත් අදාළ සහතික.

*සැළකිය යුතුය.*—ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම්පත්‍රය සමඟ නොඑවිය යුතුය.

11. *විභාග මධ්‍යස්ථාන හා ප්‍රවේශ පත්‍ර* :

(i) *විභාගය පහත සඳහන් නගරවල දී පමණක් පැවැත්වේ.* :

1. කොළඹ 2. මහනුවර 3. මාතර 4. කුරුණෑගල 5. රත්නපුරය 6. අනුරාධපුරය 7. බදුල්ල 8. අම්පාර 9. මඩකලපුව 10. ත්‍රිකුණාමලය 11. වවුනියාව 12. යාපනය 13. කිලිනොච්චි 14. මුලතිව්

(ii) ඉහත සඳහන් යම් කිසි විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක ඔවුන් ළඟම ඇති විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත.

(iii) විභාගය පැවැත්වෙන දිනය සහ ස්ථානය යනාදී විස්තර ඇතුළත් ප්‍රවේශපත්‍රයක්, විභාගයට අවම වශයෙන් දින 07කට කලින් අයදුම්කරුවන්ට තැපැල් මඟින් එවනු ලබන අතර, විභාගයට පැමිණීමේ ගමන් වියදම් හෝ වෙනත් කිසිම දීමනාවක් රජයෙන් ගෙවනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබීම මෙම තනතුර සඳහා සුදුසුකමක් සේ කිසිසේත්ම නොසැළකිය යුතුය.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාව.*- විභාග පරීක්ෂක සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත. :—

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(2) විදේශ ගමන් බලපත්‍රය;
(3) වලංගු රියැදුරු බලපත්‍රය.

13. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහු තෝරා ගැනීමට පසුව හෙළි වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

14. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනසංරක්ෂක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

වන සංරක්ෂක ජනරාල්.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවි වන නිලධාරී (ද්‍රවිඩ මාධ්‍ය) තනතුර සඳහා බඳවා ගැනීම - 2010**

නගර අංකය ☐
නගරය :———.
නිවේදනයේ අංක 11 බලන්න.

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසියෙන්) :———.
(ii) සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසියෙන්) :———.

02. ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසියෙන්) :———.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

පුරුෂ - 0 ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐

දෙමළ - T (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :

පරම්පරාවෙන් - 1 ලියාපදිංචිවීමෙන් - 2 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. උපන් දිනය :———.

2010.12.31 දිනට වයස : අවුරුදු :——. මාස :——. දින :——.

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08. කායික යෝග්‍යතාවය ඃ
උස ඃ අඩි :———.

පපුව ඃ අඟල් :———. (කාන්තා අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

09. අධ්‍යාපන සුදුසුකම් ඃ

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

1 වැනි වර 2 වැනි වර

වර්ෂය :——. විභාග අංකය:——. වර්ෂය :——. විභාග අංකය :——.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :———. විභාග අංකය :———.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

10. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :———.

11. වෘත්තීය/වෙනත් සුදුසුකම් :———.

12. (i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :———.

(ii) ලදුපතේ අංකය හා දිනය :———.

*කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.*

13. (i) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත.

(ii) ඔව් නම් විස්තර සඳහන් කරන්න :———.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර :

ආයතනය :———. තනතුර :———.

මුල් පත්වීමේ දිනය :———. වැටුප :———.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න. :

(i) ………………………………………

(ii) ………………………………………

16. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත් අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන .............................. මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී 2011...........................වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

———,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
දිනය :———.

18. අයදුම්කරු රජයේ සේවකයකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය. :—

මෙම අයදුම්පත ඉදිරිපත් කරන……………………………… මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ..................................... ලෙස ස්ථිර/තාවකාලික තනතුරක් දරන බවත්, ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බව ද මෙයින් දන්වා සිටිමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
ඔහු විසින් බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම :———.
තනතුර :———.
(මුද්‍රාව තබන්න)
දිනය :———.

(අනවශ්‍ය වචන කපා හරින්න)

සැ. යු.—ඉල්ලුම්පත්‍රය සමග මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

12-1014

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.